**දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක - 09/2026**

# රාජ්‍ය ළමා චිත්‍ර උලෙළ - 2026

ශ්‍රී ලාංකේය ළමුන්ගේ නිර්මාණ ශක්තිය වැඩිදියුණු කිරීම හා ඇගයීම මූලික පරමාර්ථය කොට වාර්ෂිකව රාජ්‍ය ළමා චිත්‍ර උලෙළ පැවැත්වේ. දිවයිනේ සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයක්ම නියෝජනය කරමින් සිසු සහභාගීත්වයක් සහිතව මෙම උලෙළ පැවැත් වේ. ළමා නිර්මාණකරුවකු වීමට අවශ්‍ය කුසලතා අත්පත් කර දීමටත් ඒ සඳහා අවශ්‍ය නිර්මාණ චින්තන ශක්තිය වර්ධනය කිරීම කෙරෙහිත් මෙම රාජ්‍ය ළමා චිත්‍ර උලෙළ නැඹුරු වෙයි.

බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය, සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව සහ රාජ්‍ය දෘශ්‍ය කලා අනුමණ්ඩලය මගින් සංවිධානය කරනු ලබන "2026- රාජ්‍ය ළමා චිත්‍ර උලෙළ" සඳහා නිර්මාණ භාරගැනීම 2026 ජුලි මස 15 වෙනි දින සිට අගෝස්තු මස 31 වෙනි දින දක්වා කොළඹ 07, ජාතික කලාභවනේ දී සිදුකිරීමට නියමිත ය.

එසේ ලැබෙන චිත්‍ර අතරින් එක් දිස්ත්‍රික්කයකින් පහත සඳහන් එක් එක් තරග අංශයෙන් නිර්මාණ 30 බැගින් නිර්මාණ 150ක් තෝරාගනු ලැබේ. එම නිර්මාණකරුවන් දෙවන වටයේ තරග සඳහා ඉදිරිපත් කරනු ලබන අතර, දෙවන වටයේ තරග දිස්ත්‍රික්ක මට්ටමින් විශේෂ වැඩමුළුවක්ද සහිත ව පැවැත්වීමට කටයුතු සංවිධානය කර ඇත. දෙවනවටය සඳහා තෝරා ගනු ලබන සියලු නිර්මාණකරුවන් වෙත සහතික පත්‍රයක් ලබාදීමට නියමිතය. දෙවන වටයේ දී අඳිනු ලබන චිත්‍ර අතරින් තෝරාගන්නා නිර්මාණ "2026 - රාජ්‍ය ළමා චිත්‍ර උලෙළ" සඳහා ඉදිරිපත් කරනු ලබන අතර, එම ජයග්‍රාහක ළමා සිත්තරුන් වෙත සම්මාන, සහතිකපත් හා මුදල් ත්‍යාග ප්‍රදානය කරනු ලැබේ.

<u>තරග අංශ</u>

| | තරග අංශය | වයස් කාණ්ඩය | | උපන් වර්ෂය |
|---|---|---|---|---|
| 1. | ප්‍රාථමික අංශය | අවුරුදු | 05 – 06 | 2020 - 2019 |
| 2. | පශ්චාත් ප්‍රාථමික අංශය | අවුරුදු | 07 – 09 | 2018 – 2017- 2016 |
| 3. | කනිෂ්ඨ අංශය | අවුරුදු | 10 – 12 | 2015 – 2014 - 2013 |
| 4. | ජ්‍යෙෂ්ඨ අංශය | අවුරුදු | 13 – 15 | 2012 – 2011 - 2010 |
| 5. | ජ්‍යෙෂ්ඨ ද්විතීයික අංශය | අවුරුදු | 16 – 18 | 2009 – 2008 –2007 |

- **විශිෂ්ට සම්මාන - 10**
  සෑම තරග අංශයක් සඳහාම ප්‍රථම, දෙවන හා තෙවන ස්ථාන වෙනුවට විශිෂ්ටයින් 10 දෙනෙකු තෝරා සම්මාන, සහතික පත්‍ර සහ මුදල් ත්‍යාග පිරිනමනු ලැබේ.

- **කුසලතා සම්මාන - 10**
  සෑම තරග අංශයක් සඳහාම කුසලතාලාභීන් 10 දෙනෙක් තෝරා සම්මාන, කුසලතා සහතික සහ මුදල් ත්‍යාග පිරිනමනු ලැබේ.

තරඟ කොන්දේසි

1. අභිමත තේමාවක්, මාතෘකාවක් හෝ වස්තුවිෂයක් සිතුවමට නැගිය හැකිය.
2. චිත්‍ර ඇඳීමට ඕනෑම මාධ්‍යයක් භාවිත කළ හැකිය.
3. චිත්‍රය අඟල් 11.7×16.5 (A3) හෝ අඟල් 18×14 ප්‍රමාණය විය යුතුය.
4. එක් අයෙකුට ඉදිරිපත් කළ හැක්කේ එක් නිර්මාණයක් පමණි.
5. නිර්මාණ ඉදිරිපත් කළ හැක්කේ නිර්මාණකරුගේ ස්ථිර පදිංචි දිස්ත්‍රික්කයෙන් පමණි.
6. තරඟය සඳහා සහභාගී වන තරඟකරුවන් තම නිර්මාණය ස්වනිර්මාණයක් බවට සහතික කරවා ගත යුතුය. ඒ සඳහා තම විහාරස්ථානයේ විහාරාධිපති ස්වාමීන්වහන්සේගේ, පූජකතුමන්ගේ, තම පාසලේ විදුහල්පතිගේ, සාමදාන විනිශ්චයකාරවරයෙකුගේ, කලායතනාධිපතිගේ හෝ තමා පදිංචි ග්‍රාම සේවා කොට්ඨාසයේ ග්‍රාම නිලධාරීගේ අත්සන සහ නිල මුද්‍රාව තබා සනාථ කළ යුතුය.
7. මේ සමග අමුණා ඇති අයදුම්පත්‍රය නිවැරදිව හා පැහැදිලිව සම්පූර්ණ කර නිර්මාණයේ පිටුපස නොගැලවනසේ ඇලවිය යුතු ය.
8. තරග කොන්දේසි සපුරා නොමැති සහ අදාළ තොරතුරු නිවැරදිව ඉදිරිපත් කර නොමැති නිර්මාණ තරගයෙන් ප්‍රතික්ෂේප කරනු ලැබිය හැක.
9. මෙම තරගය සඳහා ඉදිරිපත් කරනු ලබන නිර්මාණ නැවත භාරදෙනු නොලැබේ.
10. තරගය සඳහා ඉදිරිපත් වන නිර්මාණ ප්‍රවීණ විනිසුරු මණ්ඩලයකට යොමු කර එයින් තෝරා ගන්නා නිර්මාණකරුවන් පමණක් දිස්ත්‍රික් තරග සඳහා යොමු කරන අතර, දිස්ත්‍රික් තරග පැවැත්වෙන දිනය, වේලාව සහ ස්ථානය පසුව දැනුම්දෙනු ලැබේ.
11. සියලු නිර්මාණ ස්ථානභාර නිලධාරි, ජාතික කලාභවන, ආනන්ද කුමාරස්වාමි මාවත, කොළඹ 07 යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවීමට හෝ පැමිණ භාරදිය හැකි අතර, නිර්මාණ බහාලන ලියුම් කවරයේ හෝ පාර්සලයේ ඉහළ වම් කෙළවරේ **"රාජ්‍ය ළමා චිත්‍ර උලෙළ - 2026"** ලෙස පැහැදිලිව සඳහන් කළ යුතුය.
12. විනිශ්චය මණ්ඩලය විසින් ගනු ලබන තීරණ අවසන් තීරණ වේ.

කේ.එස්.දිල්හානි
අධ්‍යක්ෂ
සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව

විමසීම්:- ලේකම්, රාජ්‍ය දෘශ්‍ය කලා අනුමණ්ඩලය : 0112882551 / 0112872031
හෝ දිවයිනේ සියලුම දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල සංස්කෘතික නිලධාරීන් මගින් සහ Department of Cultural Affairs face book පිටුවට පිවිසීමෙන් ලබාගත හැක.

# රාජ්‍ය ළමා චිත්‍ර උලෙළ- 2026

## අයදුම්පත්‍රය

- සම්පූර්ණ නම:-...........................................................................................
- මුලකුරු සමග නම:-......................................................................................
- උපන් දිනය:-................................................................................................
- 2025.12.31. දිනට වයස:-..............................................................................
- තරග අංශය:-...............................................................................................
- මාතෘකාව :-...............................................................................................
- පෞද්ගලික ලිපිනය:-.....................................................................................
- ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය:-..........................................................................
- දුරකථන අංකය:-..........................................................................................

මේ සමග ඉදිරිපත් කරනු ලබන නිර්මාණය මාගේ නිර්මාණයක් බවත්, ඉදිරිපත් කර ඇති තොරතුරු සත්‍ය හා නිවැරදි බවත් සහතික කරමි.

..........................................
අයදුම්කරුගේ අත්සන

### <u>අයදුම්කරුගේ නිර්මාණය සහතික කිරීම</u>

ඉහත අයදුම්කරු වන....................................................................... විසින් මේ සමග ඉදිරිපත් කර ඇති චිත්‍ර නිර්මාණය ඔහු/ඇය විසින්ම අදින ලද ස්වනිර්මාණයක් බවට මෙයින් සහතික කරමි.

දිනය ...........................................

.....................................................
සහතික කරන්නාගේ අත්සන හා නිල මුද්‍රාව